INTRODUCING 1st TIME IN UK
FareDeals Travel & Tours
Fly With Someone You Trust
FareDeals Travel & Tours Ltd.
458, Alexandra Avenue, Rayner's Lane, (Opp:Tube). HA2 9TL. United Kingdom.

- All Deals Available in Colombo Market (in Rupees)
- Cheaper than Leading Agents in Colombo
- We deliver Tickets to your Door Step in Sri Lanka
- No Middlemen, Book Directly with us in London

Fly to Colombo

| | |
|---|---|
| Srilankan Air | £ 380 |
| Qatar Air | £ 290 |
| Kuwait Air | £ 250 |
| Oman Air | £ 175 |
| Ethihad Air | £ 350 |

Buy your COLOMBO to LONDON/ UK, Australia, Italy, USA, Tickets. pay in pounds or rupees.

Fly to London / UK

| | |
|---|---|
| Srilankan | Rs. 85000* |
| Qatar | Rs. 62000* |
| Kuwait | Rs. 56000* |
| Royal Jor | Rs. 58000* |

Student Offers (o /way)

| | |
|---|---|
| Srilankan | Rs. 42000 |
| Qatar | Rs. 58000 |
| Kuwait | Rs. 41200* |

* Fares subject to taxes/change

Contact - Dulip, Nimesha, Sunirma or Fernando.
Emergency Travel ctc Dulip 07551549559
0208 150 9183
Call us 0800 612 4045 info@faredealtravels.co.uk
ETIHAD Emirates CATHAY PACIFIC KUWAIT AIRWAYS SriLankan QATAR AIRWAYS

# පොලිතීන් සහ ප්ලාස්ටික් වලින් පෙට්‍රල් නිපදවයි

**ලො**ව ප්‍රථම වතාවට මෙවැනි දෙයක් සිදුවූයේ ශ්‍රීලංකාවේ ය. පාවිච්චි කොට ඉවත දමන පොලිතීන් සහ ප්ලාස්ටික් එකතු කොට ඒවා පැට්‍රල් බවට හරවා ඒ පැට්‍රල් වලින් වාහන දුවවන ලද පුවතක් දැන් යටියන්තොටින් අසන්නට ලැබේ.


*නිර්මාතෘ ආනන්ද විතානගේ මහතා*

මේ නිපදවීමේ ක්‍රම වේදය සොයාගත් ආනන්ද විතානගේ මහතාගේ අදහස පිළිගත් මධ්‍යම පරි- සර අධිකාරිය මොරටු විශ්වවිද්‍යාල යේ රසායනික ඉන්ජි නේරු අංශයේ ද සහාය ලබාගනිමින් ව්‍යාපෘතිය ගිය වසරේ දියත් කරන ලදී. එය සියයට සියයක්ම සාර්ථක වෙමින් දැන් සති දෙකකට පෙර උත්සව ශ්‍රීයෙන් ව්‍යාපෘතිය විවෘත විය. පාරිසරික ඇමති පාඨලී චම්පික රණවක මහතා අතින් එසේ නිපදවන ලද පැට්‍රල් යොදා ත්‍රීරෝද රථ කීපයක් ධාවනය කරවන ලද්දේය. මෙය නිසැකවම මහා කර් මාන්තයක් බවට පත්වන ලකුණු පෙනෙන්නට ඇත. එසේම මෙය පරිසර හිතකාමී ද වෙයි.

ඇමති චම්පික රණවක මහතා කීවේ විශාල වශයෙන් ඉවත දමන පොලිතීන් ප්ලාස්ටික් තුළින් දැන් අමතර ආදායමක් ලබන්නට හැකිවෙනවා පමණක් නොව එය පරිසරය සුරැකීමක්ද වන බවයි. එසේම මෙසේ නිපදවන පැට්‍රල් සාමාන්‍ය ඉන්ධන වලට වඩා අඩුමිලක් වන බව ද පැවසී ය.

මෙසේ සාදන ඉන්ධන හඳුන්වන්නේ **පොලිප්ටෝ පැට්‍රල්** යනුවෙනි. ඉවත ලන ප්ලාස්ටික් කිලෝ එකකින් පැට්‍රල් ලීටරයක් නිපදවන්නට හැකි බව කියති. මෙම යන්ත්‍රයෙන් දිනකට ලීටර් 500 සිට 1000 දක්වා ලබා ගත හැකියයි නිර්මාතෘ ආනන්ද විතානගේ මහතා හෙළිකළේය.

යටියන්තොට උපත ලැබූ ආනන්ද විතානගේ මහතා රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකි.

♦ *කේ. එල්. කරුණාරත්න* Sri Lanka


# Sinhala Lesson 08 සිංහල පාඩම

## සිංහල ඉගෙනීමට පහසු මගක් !

පහත දැක්වෙන සිංහල අකුරු ශබ්දකරන්නේ ඊට යටින් ඇති ඉංග්‍රීසි වචනයේ ඉරිගසා ඇති කොටස හඬ නැගෙන විධියට බව දරුවන්ට කියා දෙන්න.

**The sound of each Sinhala letter corresponds to the underlined part of the English word. Now read aloud the Sinhala letter.**

## Vowel Strokes



| | | | | | | |
|---|---|---|---|---|---|---|
| න | නා | නැ | නෑ | නි | නී | නු |
| ණ | ණා | ණැ | ණෑ | ණි | ණී | ණු |
| nut | china | nap | nan | nip | nee | Anura |


| | | | | | |
|---|---|---|---|---|---|
| නූ | නෙ | නේ | නො | නෝ | න් |
| ණූ | ණෙ | ණේ | ණො | ණෝ | ණ් |
| noon | net | name | not | no | bun |

♦ ආචාර්‍ය සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

# හරස්පද ප්‍රහේලිකා 118

**හරහට :**
1 හානිකර දෙයකි 3 ශෝකය
5 දොරකට අවශ්‍ය දෙයකි
7 කුඩා ළමයා 9 සෙනග
10 වැස්සට අව්වට පිහිට වේ
11 ඇදය

**පහළට :**
1 පිස්සු වැටුණු
2 අයිති
4 විෂ සහිත කෘමියෙකි
6 වාදන භාණ්ඩයකි
8 විලාශය 9 නීච



***ගියවර නිවැරදි විසඳුම්***
**හරහට :** 1 අති 3 රවි 5 පරවි 7 කමත 9 බාල්ක 10 මුසා 11 රථ
**පහලට :** 1 අපල 2 තිර 4 වියත 6 විකල් 8 මකර 9 බාසා

# Mr Parakrama de Silva (1928 - 2010)

## පරාක්‍රම ද සිල්වා මහතා

### Former Treasurer - Committee Member FOC rep. AOMUK



**Parakrama De Silva** passed away at his residence in Reading, UK on the 7th March 2010 at the age of 82 years. It's a great loss to his family and many others as he was very popular among friends and the community.

Parakrama had his education at Mahinda College, Galle, Sri Lanka and later became a Mechanical Engineer. He worked as a Mechanical Engineer in England and later on was a lecturer at Henley Technical College. He was a keen athlete and a swimmer, and was an instructor in scuba diving. He ran the London marathon when he was in his sixties !

Parakrama was a very committed, active committee member of the Association of **Old Mahindians in the UK** (AOMUK). He served as the Assistant Treasurer and became the Treasurer of the Association until his retirement in January 2009. He represented the AOMUK in the Festival of Cricket **(FOC)** and was a very valuable member of the FOC committee until 2009. His services were invaluable to both these organisations; his great enthusiasm to carry out the responsibilities was an encouragement to all other members.

Parakrama was a loving husband to his dear wife Chris and they celebrated 50 years of marriage last year. He was a devoted father to his children, son Geehan, daughters Arunee and Nirmalee. He was an adorable grandfather to his two lovely grandchildren Lucy and Erin and they were his joy.

**May he attain the supreme bliss of Nibbana !**

## ♥ පැටියො ඩාලිං



" පැටියො සන්ධානෙට ආසන විශාල ගාණක් ඇවිල්ලා...... පුදුම දිනිල්ලක් නේද? "
" මං හිතන්නෙ මේකත් කොම්පියුටර් ජිල්මාට් එකක් දාලා දිනන්න ඇත්තෙ... "
" කොම්පියුටර් එකෙන් එහෙම පුළුවන්ද...? "
" මං දන්නෙ නෑ....ලංකාවෙ විපක්සෙ අය කියන්නෙ ජිල්මාට් එකකින් දිනුව කියලයි "

## නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

# කජු අලුවා

***සිංහල අළුත් අවුරුද්දට ඔබ සාදන රස කැවිලි අතරට මෙම කජු අළුවා දීසියද එක්කර ගන්න.***

***අවශ්‍ය ද්‍රව්‍ය :***

| | | |
|---|---|---|
| හාල් පිටි | රා 2 ¼ | යි |
| කජු | ග්‍රෑම් 375 | යි |
| කිතුල් පැණි බෝතල් | ¾ | යි |
| සීනි | රා 1 ¼ | යි |
| වැනිලා | තේ හැඳි 2 | යි |
| තෙල් | තේ හැඳි 3 | යි |

***සාදන ක්‍රමය :***

1. හාල් පිටි තුනියට කබලෙන් බැදගන්න. කජු පොඩි කැලිවලට කඩා තෙල්වලින් රන්වන් පාට වනතුරු බැදගන්න. ඒවා ලිපෙන් එලියට බා ගත් විගස බැදපු පිටි ටිකක් තවරාගන්න.

2. පැණි හා සීනි ලිපතබා උණුකරගන්න. ඒය උකු දියරක් වූ පසු ඊට කජු දමා හැඳිගාන්න. වැනිලා ද එකතු කරන්න. ලිපේ ගිනි අඩුකර, පිටි ටික ටික දමා හොඳින් කලවම් කරගන්න. අතට දැනෙන තරමට ගොරෝසු වූ විට පිටි දැමීම නවතා හැඳිගාන්න.

3. බන්දේසියක් ගෙන එහි හොඳින් බැදපු පිටි තවරා ගන්න. දැන් ඒ මතට අලුවා මිශ්‍රණය දමා අතින් තුනීකර ගන්න. ඒ උඩට තවත් පිටි අතුරා ගනිමින් මිශ්‍රණය හතරැස් කරගන්න. එවිට අවශ්‍ය ප්‍රමාණයට අලුවා කැලි කපාගත හැකි ය.

*ප්‍රවීන සූපවේදිනී*
♦ *මොනිකා ලක්ෂමී ලොරෙන්සුහේවා* Sri Lanka

Sam's CHICKEN CHICKEN CHICKEN
Great Tasting! Great Value!
සැම්ස් චිකන්
17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432